

# මැණික් ව්‍යාපාරිකයන්ගේ සහ පතල් කරුවන්ගේ මහා සංගමය හා දෙවෙනි පරපුර වෙනුවෙන් යෝජනා කිහිපයක්

ඔබතුමන්ලා දන්නවා ලංකාව තුල දිනෙන් දින මැණික් වෙළදාම කිරීමට අපහසුතා ඇතිවන බව.
අප තවමත් ලෝකයේ වඩාත් වටිනා ව්‍යාපාරයක අතරමැදි කරුවෙකුගේ කර්තව්‍ය ඉටුකරනබව මට දැනේ.
ඒ අප බොහෝදෙනා මැණික් කපා ඔප දැමීම හා තාපකරණය පමණක් කිරීමට පුරුදුවී ඇති නිසයි.අප අතරින් ආභරණ කර්මාන්තයට පිවිස ඇත්තේ ඉතාමත් ස්වල්ප දෙනෙක් පමණයි.එහිදී අපට එකට තුනක් ලාභ ලබා ගත හැකි බව මාගේ අත්දැකීමයි.
එහිදී අපට ගනුදෙනු කරන්න ලැබෙන්නේ මැණික් පළදින අවසාන ගැනුම්කරු සමගයි.
ලොව වටිනාකමින් ඉතා ඉහළ මෙන්ම ඉහල ඉල්ලුමක් ඇති මැණික් හමුවන දිවයින මේ ලංකා තලයේ උපත ලැබීමටත් මැණික් වෙලදාම කිරීමටත් අප පින් කර ඇත්තෙමු.
නමුත් එම මැණික් වලට නිසි වටිනාකමක් අප විසින් ලබානොගන්න බව මාගේ අදහසයි.
එහීදී මැණික් ව්‍යාපාරිකයන්ගේ හා පතල්කරුවන්ගේ මහා සංගමය වෙනුවෙන් හා කර්මාන්තයේ අනාගත දියුණුව වෙනුවෙන් පහත සදහන් කරුණු ඉදිරිපත් කරමි

## **1.**තොරතුරුවල අඩුව

**Questions**

පළමු කරුණනම් සංගමයක් වශයෙන් අපගේ තොරතුරු වෙනත් පාර්ශවයක් විසින් සොයාගන්නේ කෙසේද යන්නයි.
මැණික් ව්‍යාපාරිකයන්ගේ හා පතල්කරුවන්ගේ මහා සංගමයේ රාජකාරී ලිපිනය කුමක්ද?දුරකථන අංකය කුමක්ද?Email ලිපිනය කුමක්ද?වෙබ් අඩවිය කුමක්ද? සංගමයේ අරමුණ කුමක්ද?ඒ වෙනුවෙන් අප කරන කටයුතු මොනවාද?
2018 වර්ෂයේ අරමුණු මොනවාද?

**Answers**

මේ සදහා වෙබ් අඩවියක් / Online තොරතුරු ලබාගතහැකි ක්‍රමයක් අපට සාදන්න පුලුවන්.

## **2.**සාමාජිකයන්

**Questions**
සාමාජිකයන්ගේ වගකීම් හා ඔවුන්ට ඇති ප්‍රතිලාභ මොනවාද?
ඔවුන්ගේ සාමාජික මුදලින් ඔවුන්ට ලැබෙන ප්‍රතිලාභ මොනවාද?
සාමාජිකයෙකු තෙවන පාර්ශවයක් / ගනුදෙනුකරුවෙකු විසින් හදුනාගන්නේ කෙසේද?
සාමාජික අංකය හා අනන්‍යතාවය තහවුරු කිරීමේ හැදුනුම්පතක් තිබේද?

**Answers**
මේ සදහා අපට QR Code එකක් සමග හැදුනුම්පතක් නිකුත් කරන්න පුළුවන් .තත්පර කිසිපයකින් අපට සාමාජිකයා QR Code එකෙන් තහවුරු කරන්න පුළුවන්.එමෙන්ම ව්‍යයාජ ව්‍යාපාරිකයන් අප සංගමයෙන් ඉවත් කරන්නත් පුළුවන්.වෙබ් අඩවිය හරහා සාමාජිකයන් පහසුවෙන් බදවාගත හැක.එමෙන්ම ඔවින්ගේ ගැටළු වෙබ් අඩවිය හරහා යොමුකරන්නත් ඒවාට පහසුවෙන් විසදුම් සපයන්නත් පුළුවන්.අපට ඉදිරියේදී කාර්යාලයක් පවත්වාගෙන යාමට හැකිනම් වේගවත්ව සාමාජිකයින් ප්‍රමාණය වැඩිකරගෙන වෙළදපොල විශාල කරගන්න පුළුවන්.අපට ලගාකිරීමට තිබෙන අරමුණු ඔවුන්ට ඉතා ඉක්මනින් දැනුම්දීමට තිබෙන පහසුම ක්‍රමය Web හා Email සේවාවයි.එමෙන්ම SMS හා WahtsApp අපට භාවිතා කල හැක.

අපගේ ව්‍යාපාරයට දෙවෙනි පෙළක් නොමැතිකම නිසා තවත් වසර කිසිපයකින් තරුණ නියෝජනයක් නොමැතිවේ.
එවිට විදේශිකයන් වෙළදපොල ආක්‍රමණය කරනු ඇත.ඔවුන්ගේ දෙවෙනි පරපුර මැණික් හා ස්වර්ණාභරණ ව්‍යාපාරය වේගයෙන් ඉගෙනගන්නා අතර බොහෝ පිරිස් රළු මැණික් මිලදීගැනීමට යොමුවී ඇත.

මැණික් හා පතල්කරුවන්ගේ සංගමයේ Booth එකක් ලංකාවේ මෙන්ම විදේශ රටවල පවත්වන ප්‍රදර්ශන සදහා අපට පවත්වාගෙන යාහැක.එවිට ගැනුම්කරුවන්ට පහසුවෙන් අපහා සම්භන්ධවී සිටින මැණික් සපයන්නන් පහසුවෙන් හදුනාගත හැක.එවිට සපයන්නන් ලංකාවේ සිටියත් ඔවුන්ව සම්භන්ධ කරගෙන ලංකාවට පැමිණ වෙළදාමට යොමුවිය හැක.

### 3.සංචාරක කර්මාන්තය හා සම්භන්ධ මැණික් ව්‍යාපාරය.

**Questions**
වසරකට මිලියන දෙකකට වඩා සංචාරකයන් ලංකාවට පැමිණෙනවා.ඔවින්ගෙන් 20% පමණ මැණික් මිලදීගැනීමට විශාල කැමත්තක් දක්වනවා.
නමුත් රත්නපුරයට පැමිණෙන්නේ ඉතාම සුළු පිරිසක් පමණයි.

**Answers**
අප සංචාරක සමාගම් සමග මේ සන්බන්ධයෙන් කථා කර Tourism Route එකක් රත්නපුරයට ලබාගත යුතුයි.
පතල් ,දියඇලි ,වනාන්තර ,ගංගා ,පූජනීය ස්ථාන ,භාවනා මද්‍යස්ථාන ,මැණික් හා ස්වර්ණාභරණ මිලදීගන්නා ස්ථාන ,හෝටල් හා ආපනශාලා අපට ප්‍රචාරණය කල හැක .

එයට ප්‍රථමයෙන් අපගේ ව්‍යාපාරිකයන් දිරිමත්කර ඔවින්ට තාක්ෂණය ලබාදිය යුතුය .මැණික් ගල් සහතිකයක් සමග විකිණීම ,Invoice එකක් නිකුත් කිරීම,Visa හා Master

Card හරහා මුදල් ලබාගැනීමට පහසුකම්,ඔවින්ට වෙබ් අඩවියක් හෝ වෙබ් පිටුවක්,ඔවුන්ට Review System එකක් ආදී වගකීමක් ඇති හා වැදගත් ( Professional ) ව්‍යාපාර කරන ආකාරය වේගවත්ව මාහට ඔවුන්ට පෙන්වාදිය හැක.ඔවින්ට ව්‍යාපාරයට අවශ්‍ය භාෂා දැනුම ඉක්මනින් ලබාදිය හැකි ක්‍රම මා දනිමි.අපට / බොහෝ ව්‍යයාපාරිකයන්ට දැනටමත් කාර්යාල තිබේ .ඒවායේ මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශන කුටියක් කුඩාවට හෝ එකතු කල හැක.කාර්යාලයේ සිටම මෙම කර්තවයන් පහසුවෙන් සිදුකල හැක .

## 4.ව්‍යාපාර ක්‍රම

**Questions**

අද්දවස වනවිට මැණික් වෙලදාම් කරන ක්‍රම ඉතාමත් යල්පැන ඇත.බොහෝවිට ගනුදෙනු වලදී වංචා සිදුවන්නේ මේ නිසයි.හැකි හා කැමත්තක් දක්වන සියලුදෙනා Invoice එකක් භාවිතා කරන්නේනම් බොහෝ ගනුදෙනු විනිවිධභාවයකින් සිදුවනු ඇත.ඒ සදහා වෙළෙන්දන් දිරිමත් කිරීම හා මගපෙන්වීම සංගමයේ වගකීමක් වේ.

**Answers**

මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ සහතිකය මෙන්ම අප සංගමයේද සහතිකයද වැදගත් එකක් වනවානම් වංචාකාරයන්ට වෙළදපලට ඇතුල්වීමට නොහැක .කිමද අප සාමාජිකයන් සෑම තැනකම සිටින නිසාත් ඔවින්ට පහසුවෙන්ම වැරදි කරන පුද්ගලයන් ගැන තොරතුරු අපට වාර්තා කල හැ කි ක්‍රමයක් අප සාදාදෙන නිසාත්ය.

රැකියා විශාල ප්‍රමාණයක් බිහිකිරීම ඉබේම සිදුවන නිසා රැකියා ගැන සදහන් නොකලෙමි.
තැබිලි විකුනන්නාගේ සිට හෝටල් හිමියන් සංචාරක කර්මාන්තයේ යෙදෙන්නන්නන් ආදී සියලුදෙනා මෙම වැඩසටහන තුලින් ප්‍රතිලාභ අත්කරගනා බව ඔබට වැටහෙනු ඇත.මාළු ඉල්ලන කෙනෙක්ට මාළු දීමට වඩා මාළු අල්ලාගන්නා ක්‍රමයක් පෙන්වාදීම වඩාත් වැදගත් බව මාගේ හැගීමයි.එවිට අපට සාර්ථක පුද්ගලයන් / ව්‍යාපාරිකයන් බිහිකළ හැකිවනු ඇත.

## වාසි හා ප්‍රතිලාභ / **Benefits**

*විශාල රැකියා අවස්ථා ප්‍රමාණයක් බිහිවේ.
*මැණික් කර්මාන්තය ස්ථාවර කිරීම සිදුවේ.
*තාක්ෂනය සමග ඉදිරියට යන ව්‍යාපාරිකයන් ඇතිවේ
*ශක්තිමත් දෙවෙනි පෙළක් බිහිවේ.

ඉහත දැක්වූ කරුණු කිහිපය ඉතා ඉක්මනින් 2018 වසර තුල අපට කල හැකි කාර්යයන්ය .මෙයට අමතරව ඔබගේ යෝජනා හා අදහස් ඉදිරිපත් කිරීමත් මෙම කරුණු සලකා බලා අනුමත කිරීමත් සභාපතිතුමා ඇතුලු සංගමයේ ප්‍රධාන සාමාජිකයන් සතුය.

අප අද ක්‍රියාත්මක වුවහොත් තවත් වසර කිහිපයකින් ලංකාව මැණික් කර්මාන්තයේ වැදගත් මද්‍යස්ථානයක් කිරීමට දායකවීමට හැකිවීම අප සියල්ලගේම මහත් භාගයක් වනු ඇත.

මෙම කටයුත්තේදී මා දිරිමත් කිරීම හා මගපෙන්වීම කල , අද්‍යනය කල ,පහසුකම් සැපයු මැණික් කර්මාන්තයේ අනාගතය ගැන දැක්මක් ඇති නිහාල් මැණික් ආයතනයේ නිහාල් මැතිතුමාට ,අද මෙමෙ අවස්ථාවට පැමිණි ගරු සභාපතිතුමා ඇතුලු ප්‍රධාන නිලධාරීන් සියලු දෙනාට විශේෂ ස්තුතිය පිරිනමමි.

මෙම යෝජනා මාලාව ඉදිරි කාරක සභාවට ඉදිරිපත්කර ක්‍රියාත්මක කරන්නේද නොකරන්නේද යන කරුණ ගැන මා දැනුවත් කරනමෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

සම්පාදනය හා ඉදිරිපත් කිරීම :
සම්පත් සමරසේකර
**Phone : 0777 576 897**
**Website : www.sampathgems.com**